**30-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මෙය පියා, වැරදී ඇති තැන් නිවැරදි කිරීමට පැමිණෙන, අවිහිංසක ස්වාමියා, ගුරුවරයා වශයෙන් අපට ඉගැන්වීමට පැමිණෙන, ආශ්චර්යමත් විශ්ව විද්‍යාලයයි.

**ප්‍රශ්නය:** මෙම ගිණුම් පියැවීමේ කාලයේදී ඔය දරුවන් සෑම කෙනෙකුටම ලබා දෙන අරමුණ කුමක්ද?

**පිළිතුර:** අහෝ ජීවයනි, දැන් පිවිතුරු වන්න! පිවිතුරු නොවී කිසිවෙකුට ආපසු නිවසට යාමට නොහැක. චක්‍රයෙන් භාගයක්ම සෑම කෙනෙකුටම වැලඳී තිබුණු රෝගයෙන් ඔවුන්ව නිදහස් කිරීම සඳහා, ඔබ ඔවුන්ව දින හතක් උඳුනක ඉන්දවයි. අපවිත්‍ර ආශ්‍රයෙන් ඔවුන් ඈත්ව සිටින විට සහ ඔවුන් වෙනත් කිසිවෙක් සිහි නොකරන විට පමණයි, ඔවුන්ගේ බුද්ධියට දැනුම ධාරණය කරගැනීමට හැකි වන්නේ.

**ගීතය:** ඔබ රාත්‍රිය නිදමින්, දිවාකල බුදිමින් අපතේ හැරියා.

ඕම් ශාන්ති. දරුවන්ට මෙය පැවසුවේ කවුරුන්ද? ඔබ පාසැලක අසුන් ගෙන සිටින බැවින්, නිසැකවම මෙසේ කීවේ ගුරුවරයා විය යුතුයි. මෙය පැවසුවේ පියාද, ගුරුවරයාද, සත්ගුරුද යන ප්‍රශ්නය මතුවෙයි. මෙම වැකි පැවසුවේ කවුද? ඔහු අපගේ අසීමිත පියා බවත් ඔහුට පරම පියා, පරමාත්ම ජීවය යැයි කියනා බවත් පළමුවෙන්ම දරුවන්ගේ බුද්ධියට ඇතුළු විය යුතුයි. එබැවින් එය පැවසුවේ පියා මෙන්ම ගුරුවරයා මෙන්ම සත්ගුරුද එය පැවසුවා. ඔබගෙන් ශිෂ්‍යයන් වන අයගේ බුද්ධියේ මෙය තිබේ. වෙනත් කොලීජ් හෝ විශ්ව විද්‍යාල වල උගන්වන ගුරුවරයෙකුට, පියෙක් හෝ ගුරු කෙනෙක් යැයි නොකියයි. මෙයද ඉගෙන ගන්නා ස්ථානයක් වන අතර එයට කොලීජියක් හෝ විශ්ව විද්‍යාලයක් කියා ඔබට කිව හැක. කෙසේවෙතත්, එය ඉගෙනුමකි. මෙම පාසැලේ ඔබට උගන්වන්නේ කවුරුන්ද කියා ඔබ පළමුවෙන්ම වටහාගත යුතුයි. සියලුම ජීවාත්මයන්ගේ පියා වන අශාරීරික කෙනා, සියල්ලන්ටම විමුක්තිය පිරිණමන කෙනා අපට උගන්වන බව ඔය දරුවන් දන්නවා. සියලු නිර්මාණය, එම ඒකායන නිර්මාපකයාගේ දේපළයි. එබැවින් ඔහුම මෙහි අසුන්ගෙන ඔබට නිර්මාණයේ ආරම්භය, මධ්‍යය සහ අවසානය පිළිබඳ රහස් කියයි. ඔය දරුවන් පියාට ඉපදී ඇත. ඔහු සියලු ජීවාත්මයන්ගේ පියා බවත්, ඔහුට දැනුමේ මහා සයුර මෙන්ම දැනුමින් පිරි කෙනා යැයි කියන බවත් ඔබගේ බුද්ධියට වැටහෙයි. දැනුමේ මහා සාගරය, පාරිශුද්ධකරුයි. විමුක්තිය තිබිය හැක්කේ, දැනුම තුළින් පමණයි. මනුෂ්‍යයන්, පිවිතුරු බවින් අපවිත්‍ර වෙයි. ඔය දරුවන් දැන් මෙහි අසුන් ගෙන සිටිනවා. ඔවුන්ට උගන්වන්නේ දැනුමේ මහා සාගරය, අශාරීරික කෙනා බව, වෙනත් කිසිම පාසැලක ඇති අයගේ බුද්ධියට ඇතුළු වන්නේ නැත ඔබ මෙය දන්නේ මෙහිදී පමණයි. මෙය පහදා දෙන්නේ ඔබට පමණයි. ඔවුන්ට උගන්වන්නේ අශාරීරික පරමාත්ම පියා බව, සාමාන්‍යයෙන් ලෝකයේද, විශේෂයෙන් භාරතයේද කිසිම කෙනෙකුට නොවැටහෙයි. ඔවුන්ට උගන්වන්නේ මනුෂ්‍ය ගුරුවරුන් පමණයි. තමන් ජීවාත්ම, යන දැනුවත් බව ඔවුන්ට නොමැත. ඉගෙනගන්නේ ජීවාත්මයයි. සෑම දෙයක්ම කරන්නේ ජීවාත්මයයි. ජීවාත්ම, ඉන්ද්‍රියන් හරහා අහවල් ඊකියාව කරයි. ඔවුන් අහවල් කෙනා බව ඔවුන්ගේ සිහියේ ඇත ඔවුන්ට විගසින් ඔවුන්ගේ නම සහ රුව සිහි වෙයි. 'මම මේ දේ කරනවා' හෝ 'මම ඒ දේ කරනවා'. ඔවුන්ට සිහිවන්නේ ශරීරයේ නම පමණයි. කෙසේවෙතත්, එය වැරදියි! පළමුවෙන්ම අප ජීවාත්ම වන අතර පසුව අපි ශරීර අරගන්නවා. ශරීරයේ නම දිගටම වෙනස් වන නමුත් ජීවාත්මයේ නම වෙනස් වන්නේ නැත. ජීවාත්මයේ නම එකකි. පියා පවසා තිබෙන්නේ ජීවාත්මය වන මට තිබෙන්නේ ශිවා යන එක් නම පමණයි. මුළු ලෝකයම මෙය දන්නවා. එම සියලුම වෙනත් නම් දෙනු ලබන්නේ ශරීරයටයි. ශිව බාබාව අමතන්නේ ශිවා කියා පමණයි, එපමණයි! ඔහුට පෙනෙන සිරුරක් නැත. නම් දෙනු ලබන්නේ මනුෂ්‍යයන්ටයි මම අහවලාය. මට උගන්වන්නේ අහවල් ගුරුවරයාය ඔබ නම සඳහන් කරයි. ඇත්ත වශයෙන්ම, සිරුරක් තුළින් ජීවාත්මයක්, ගුරුවරයෙකුගේ කාර්යය ඉටු කරමින් වෙනත් ජීවාත්මයකට උගන්වයි. සංස්කාර තිබෙන්නේ ජීවාත්මය තුළයි. ජීවාත්මයක්, ඉන්ද්‍රියන් තුළින් උගන්වා, ඔහුගේ සංස්කාර වලට අනුව ඔහුගේ චරිත කොටස රඟපායි. කෙසේවෙතත්, සෑම දෙයක්ම ක්‍රියාත්මක වන්නේ, ශරීර වලට ලබා දී ඇති නම් වල පදනමට අනුවයි. මෙහිදි ඔබට උගන්වන්නේ අශාරීරික පියා බව, ඔය දරුවන් දන්නවා. ඔබගේ බුද්ධිය ගමන් කළේ කොහාටද? ජීවාත්මය වන මා, දැන් අයත් වන්නේ පියාටයි. අශාරීරික පියා පැමිණ, ශාරීරික ස්වරූපය තුළින් ඔබට උගන්වන බව, ජීවාත්මයට වැටහෙනවා. ඔහුගේ නම ශිවාය. මිනිසුන්ද ශිවාගේ ජන්ම දිනය සමරයි. ශිවා, අසීමිත පියාය. එබැවින් පරම

පියා, පරමාත්ම ජීවය යැයි කියන්නේ ඔහුට පමණයි ඔහු සියලුම ජීවයන්ගේ පියාය. ඔවුන් ඔහුගේ ජන්ම දිනය සමරන්නේ කෙසේද? ජීවාත්මය, සිරුරකට ඇතුළු වනවාද, එසේ නැත්නම් මව් කුසකට ඇතුළු වනවාද? ජීවාත්මය පැමිණෙන්නේ උඩ ඉහළ සිට බව, කිසිම කෙනෙක් නොදනී. ක්‍රිස්තුස්වහන්සේ ආගමක නිර්මාතෘවරයා ලෙස හැඳින්වෙයි. ඔහුගේ ජීවාත්මය පළමුවෙන්ම පැමිණිය යුත්තේ උඩ ඉහළ සිටයි. සතෝප්‍රධාන් ජීවාත්මයක් පහළට පැමිණෙයි ඔහු කිසිම පාපකාරී ක්‍රියාවක් සිදුකර නැත. ජීවයක් ආරම්භයේදී සතෝප්‍රධාන් වන අතර, ඉන්පසුව ඔහු සතෝ, රජෝ සහ තමෝ තත්ත්ව හරහා යන විට, ඔහු පාපකාරී ක්‍රියා සිදු කරයි. ඔහු පහළට පැමිණෙන විට, ජීවයක් ආරම්භයේදී සතෝප්‍රධාන් බැවින්, ඔහුට කිසිම දුකක් අත් විඳිය නොහැක. එම ජීවාත්මය ඔහුගේ කාලයෙන් භාගයක් පහළ සිට ඇති විට පමණයි, ඔහු පාපකාරී ක්‍රියා කිරීම ආරම්භ කරන්නේ. වසර 5000කට පෙර සැබවින්ම සූර්ය-රජ පෙළපත් රාජධානිය පැවතුණි. අන් සියලුම ආගම් ආරම්භ වුනේ පසුවයි. භාරතයේ ජනයා, ලෝකයේ පාලකයන් විය. භාරතයට අවිනාශී භූමිය යැයි කියයි. වෙනත් භූමි නොතිබිණි. වැරදී ඇති සෑම දෙයක්ම නැවත නිවැරදි කරවන ඒකායනය, ශිව බාබාය. අවිහංසක ස්වාමියා ලෙස හැඳින්වෙන්නේ ශංකර් නොව, ශිවාය. වැරදී ඇති සෑම දෙයක්ම නැවත නිවැරදි කරවන ඒකායනය, අවිහිංසක ස්වාමියා, ශිවාය. ශිවා සහ ශංකර් එක්කෙනෙක් නොවෙයි ඔවුන් එකිනෙකාගෙන් වෙනස්ය. බ්‍රහ්මා, විෂ්ණු හෝ ශංකර්ගේ වර්ණනාවක් නැත. වැරදී ඇති සෑම දෙයක්ම නිවැරදි කිරීම වෙනුවෙන් වර්ණනා කෙරෙන්නේ ශිවාට පමණයි. ඔහු පවසන්නේ මම සාමාන්‍ය මහළු සිරුරකට ඇතුළු වෙමි. මෙම කෙනා ඔහුගේ උපත් 84 අවසන් කර ඇති අතර, නාටකය දැන් නිම වීමටයි යන්නේ. මෙම පැරණි ඇඳුම සහ මෙම පැරණි නෑදෑකම් සියල්ලම විනාශ වීමටයි යන්නේ. දැන් ඔබ සිහි කළ යුත්තේ කාවද? ඔබ විනාශ වීමට ඇති දේවල් සිහි කරන්නේ නැත. අළුත් නිවසක් ගොඩනැගෙන විට, ඔබගේ හදවත පැරණි නිවසෙන් ඉවත් වෙයි. මෙය අසීමිත කාරණාවකි. සෑම කෙනෙකුටම විමුක්තිය ලැබෙයි, එනම්, සෑම කෙනෙක්ම රාවණගේ රාජධානියෙන් නිදහස ලබයි. රාවණ සෑම කෙනෙකුවම නරක් කර ඇත. භාරතය, මුළුමනින්ම දුගී මෙන්ම දූෂිතයි. මිනිසුන්, දූෂණයට, වංචාව සහ බාල කිරීම යැයිද, සොරකම සහ රැවටීම යැයිද කියයි. කෙසේවෙතත්, පියා පවසන්නේ දූෂණයේ පළමු ස්වරූපය වන්නේ අපවිත්‍ර වීමයි. මෙයට දූෂිත ලෝකය යැයි කියන්නේ, ශරීර, පාපය තුළින් නිර්මාණය වන බැවින්ය. ස්වර්ණමය යුගයට දූෂණයෙන් තොර ලෝකය යැයි කියයි. ස්වර්ණමය යුගයේදී අපි ගෘහ මාවතේ දේවතාවන් විය. මිනිසුන් පිවිතුරුව රැඳී සිටිමින් පාපයේ නොගැලෙන්නේ නම්, දරුවන් උපදින්නේ කෙසේද කියා ඔවුන් අසන විට, ඔබගේ රාජධානිය ස්ථාපිත කරන්නේ භෞතික බලයන් නොව, යෝගා බලයෙන් බව ඔවුන්ට පවසන්න. එබැවින් එය පිවිතුරු ගෘහස්ත ඇති, දූෂණයෙන් තොර ලෝකය බැවින්, යෝගා බලයෙන් දරුවන්ට උපත ලද නොහැකිද? රජ සහ රැජිණ මුළුමනින්ම පාරිශුද්ධ වන ආකාරයෙන්ම, පුරවැසියන්ද එසේමයි. මෙහි සියල්ලන්ම සම්පූර්ණයෙන්ම දූෂිතයි. ස්වර්ණමය යුගයේ පාපයන් නැත. එය දේවමය රාජධානිය ලෙස හැඳින්වෙයි. එය ස්ථාපිත කරන්නේ පරමාත්ම පියා වන පරමාත්ම දෙවියන් විසිනි. දැන් එය රාවණගේ රාජධානියයි. දිව්‍ය ලෝකය, ස්ථාපනය කරන ශිව බාබා වන්දනාවට ලක් වෙයි. අපාය ස්ථාපිත කළ රාවණව පුළුස්සා දමයි. තඹ යුගය ආරම්භ වූයේ කවදාද කියා කිසි කෙනෙක් නොදනී. මෙයද වටහා ගත යුතු දෙයක්. මෙය තමෝප්‍රධාන් රකුසු ලෝකයයි. එය, දිව්‍යමය ලෝකයයි. එයට පිවිතුරු දිව්‍යමය ලෝකය, දිව්‍ය ලෝකය යැයි කියයි. මෙය අපවිත්‍ර ලෝකය වන අපායයි. දිනපතාම ඉගෙන ගන්නා අයට පමණයි මෙම දේවල් වැටහෙන්නේ. බොහෝ දෙනෙක් පවසන්නේ මෙම ස්ථානයේ (මධුබාන් වල) පාසැලක් නොමැති බවයි. අහා! නමුත් ප්‍රධාන කාර්යාලය මෙයයි! ඔබට මෙහි පැමිණ, උපදෙස් ලබා ගත හැක. එය ලොකු දෙයක් නොවෙයි. ලෝක චක්‍රය, තත්පරයකදී විස්තර කෙරෙයි. ස්වර්ණමය සහ රිදී යුගයන් පසු වී ඇති අතර තඹ සහ කලි යුගයන්ද දැන් ගෙවී ගොස් ඇත. එය දැන් සංගම යුගයයි. ඔබ නව ලෝකයට යාමට ඉගෙන ගත යුතුයි. ඉගෙන ගැනීමට සෑම කෙනෙකුටම අයිතියක් තිබේ. 'බාබා, මා මෙම රැකියාව කරනවා.' අච්චා, පළමුව පැමිණ එක සතියකට මෙම දැනුම ලබා ගෙන ආපසු යන්න, එවිට ඔබට අඛණ්ඩව මුරලි ලැබෙයි. මුලින් ඔබ අනිවාර්යෙන්ම දින හතක් උඳුනක සිටිය යුතුයි. ඔවුන් දින හතක් පැමිණෙන නමුත් සෑම කෙනෙකුගේම බුද්ධිය එක වගේ තිබෙන්නේ නැත. දින හතක් උඳුනක සිටිනවා යනු, එම කාලය තුළදී ඔබ කිසි කෙනෙක් සිහි නොකළ යුතු බවයි. කිසි කෙනෙක් සමඟ ලිපි හුවමාරු කිරීමක්වත් නොතිබිය යුතුයි. සෑම කෙනෙකුටම එකම ප්‍රමාණයට වටහාගත නොහැක. මෙහි, අපවිත්‍ර අය, පිවිතුරු විය යුතුයි. මෙයත් රෝගයකි මනුෂ්‍යයන් චක්‍රයෙන් අඩක්ම රෝගීව සිට ඇත. ඔවුන් වෙනම අසුන් ගැන්විය යුතුයි. ඔවුන්ට කිසිම ආශ්‍රයක් නොතිබිය යුතුයි. ඔවුන් පිටතට යන්නේ නම්, ඔවුන් අපවිත්‍ර අය විසින් පිසින ලද අපවිත්‍ර ආහාර අනුභව කරනු ඇත. ස්වර්ණමය යුගයේ ඔවුන් පිවිතුරු දේවතාවන් විය. බලන්න, මිනිසුන් ඔවුන් වෙනුවෙන් විශේෂ දේවාල තනන ආකාරය දෙස! අපවිත්‍ර අයට දේවතා පිළිරූ ස්පර්ශ කළ

නොහැක. මෙකල, මනුෂ්‍යයන් මුළුමනින්ම අපවිත්‍ර මෙන්ම දූෂිතය. ඔවුන්ගේ ශරීර විෂ තුළින් නිර්මාණය වී ඇත, ඔවුන්ට දූෂිත යැයි කියන්නේ මේ නිසාය. සන්‍යාසීන් ගේ සිරුරු පවා, නිර්මාණය වී ඇත්තේ විෂ මගිනි. පියා පවසන්නේ පළමුවෙන්ම, ජීවාත්මය පිවිතුරු විය යුතුයි. ඉන්පසුව, ශරීරයද පිවිතුරු විය යුතුයි. සියලුම පැරණි, අපවිත්‍ර ශරීර විනාශ වී යන්නේ මේ නිසාය සෑම කෙනෙක්ම ආපසු නිවසට යා යුතුයි. ගිණුම් පියවීමේ කාලය මෙයයි සෑම කෙනෙක්ම පිවිතුරු වී ආපසු නිවසට යා යුතුයි. හෝලිකා උත්සවය සමරන්නේ, භාරතයේ මිනිසුන් පමණයි. මෙහි, පංච මහා භූතයන්ගෙන් සෑදී ශරීර, තමෝප්‍රධාන්‍ය. ස්වර්ණමය යුගයේ ශරීර, සතෝප්‍රධාන්‍ය. ශ්‍රී ක්‍රිෂ්ණාගේ පිංතූරය තිබේ. ඔබ ස්වර්ණමය යුගයට යා යුතු බැවින් අපායට පයින් ගැසිය යුතුයි. මළමිණියක් සොහොන් බිමට රැගෙන යන විට, මුහුණ පළමුව තිබෙන්නේ නගරය දෙසට වන අතර පාද තිබෙන්නේ සොහොන් බිම දෙසටයි. කෙසේවෙතත්, සොහොන් බිමට ඇතුළු වන විට ඔවුන් මළකඳ හරවයි. ඔබ දැන් දෙව්ලොව යන බැවින් ඔබගේ මුහුණු තිබෙන්නේ ඒ දෙසටයි. ඔබගේ මුහුණු තිබෙන්නේ නිහඬ දේශය සහ සතුටු දේශය දෙසට වන අතර ඔබගේ දෙපා තිබෙන්නේ දුක් දේශය දෙසටය. එය මළමිණියක් පිළිබඳ කාරණාවක් වන අතර මෙහිදී ඔබ උත්සාහ දැරිය යුතුයි. මිහිරි නිවහන සිහි කරන අතර ඔය ජීවාත්ම, මිහිරි නිවහනට යයි මෙය ඔබගේ බුද්ධිය පුහුණු කළ යුතු දෙයකි. පියා මෙතැන අසුන් ගෙන ඔබට සියලුම රහස් කියා දෙයි. ඔබ දැන් ආපසු නිවසට යා යුතු බව, ඔය ජීවයන් දන්නවා. මෙය පරණ ඇඳුමක් සහ පරණ ලෝකයකි. නාටකය නිමා වී ඇති බව කීම යනු, ඔබ ඔබගේ උපත් 84හි චරිත කොටස් රඟපා ඇති බවයි. සෑම කෙනෙක්ම උපත් 84ක් නොගන්නා බවත් විස්තර කර ඇත. පසුව වෙනත් ආගම් තුළට පැමිණෙන අය, නිසැකයෙන්ම අඩු උපත් සංඛ්‍යාවක් ගනී. බෞද්ධයින්ට, ඉස්ලාමිකයින්ට වඩා අඩු උපත් සංඛ්‍යාවක් තිබේ. ක්‍රිස්තියානුවන්ට ඊටත් වඩා අඩු උපත් ගණනක් තිබේ. සීක්වරුන් ගුරු නානක් ගැන විශ්වාස කරති ඔවුන් පැමිණියා විතරයි. ගුරු නානක් පැමිණියේ, දැනට වසර 500කට පෙර පමණයි. එබැවින් ඔවුන් උපත් 84ක් නොගනී. මෙය ගණන් බැලිය හැක. වසර 5000කදී මෙපමණ උපත් තිබෙන බැවින්, වසර 500කදී මෙපමණ උපත් තිබිය යුතුයි ඇතැම් විට 12ක් හෝ 13ක්. ක්‍රිස්තුස් වහන්සේ පැමිණ දැනට වසර 2000කි. එබැවින් එම කාලය තුළ, ජීව කොපමණ උපත් ගන්නට ඇත්ද? උපත් සංඛ්‍යාවෙන් භාගයකටත් වඩා අඩු ගණනක් වනු ඇත. ගණනය මෙයයි. ඇතැමුන් මෙපමණ උපත් සංඛ්‍යාවක්ද තවත් සමහරෙක් තවත් සංඛ්‍යාවක්ද ගන්නා නමුත් උපත් කොපමණක්ද කියා ඔබට නිවැරදිව කිව නොහැක. මෙම දේවල් ගැන තර්ක කරමින් ඔබ කාලය වැඩිය අපතේ නොහැරිය යුතුයි. ඔබගේ වගකීම වන්නේ පියාව සිහි කිරීමයි. ඔබගේ බුද්ධි, නිෂ්ඵල කාරණා වලට භාවිත නොකරන්න. පියා සමඟ යෝගාවේ සිට, චක්‍රය වටහා ගන්න, මන්ද, සිහිපත් කිරීමේ සිටීමෙන් පමණයි ඔබගේ පාපයන් දුරු වන්නේ. මේ සඳහා උත්සාහයක් අවශ්‍යයි. භාරතයේ පෞරාණික යෝගාව ගැන මිනිසුන් කතා කරන්නේ මේ නිසාය. මෙය උගන්වන්නේ පියා පමණයි. ස්වර්ණමය සහ රිදී යුගයන්හිදී, යෝගාව පිළිබඳ ප්‍රශ්නයක් නැත. පසුව භක්ති මාර්ගයේදී හත යෝගාව ආරම්භ වෙයි. මෙය පහසු රාජයෝගාවයි. පියා පවසන්නේ මා සිහි කිරීමෙන් පිවිතුරු වන්න. ප්‍රධානතම දේ වන්නේ සිහිපත් කිරීමය. කිසිම පාපයක් සිදු නොකරන්න. දේවතාවන් වෙනුවෙන් දේවාල ගොඩනැඟෙන්නේ ඔවුන් පිවිතුරු නිසාය. දේවාල බලාගන්නා පූජකයන් අපවිත්‍රයි. ඔවුන් පිවිතුරු දේවතාවන්ගේ පිළිරූ නහවයි. ඇත්ත වශයෙන්ම අපවිත්‍ර අයගේ අත්වලින් වත් ඔවුන්ව ස්පර්ෂ නොකළ යුතුයි. ඒ සියල්ලම භක්ති මාර්ගයේ චාරිත්‍ර වාරිත්‍රයි. අපි දැන් පිවිතුරු වෙමින් සිටිනවා. අප පිවිතුරු වූ විට, අපි දේවතාවන් වෙයි. එහිදී වන්දනා ආදිය කිරීමට අවශ්‍ය නැත. සියල්ලන්ටම විමුක්තිය පිරිණමන්නේ ඒකායන පියා පමණයි. අවිහිංසක ස්වාමියා ලෙස හැඳින්වෙන්නේ ඔහු පමණයි. මම රාවණගේ පැරණි රාජධානියේ, අපවිත්‍ර සිරුරකින් අපවිත්‍ර ලෝකයට ඇතුළු වෙමි. ඔව්, ඔහුට ඕනෑම කෙනෙකුගේ සිරුරට ඇතුළු වී මුරලිය පැවසිය හැක. ඉන් කියැවෙන්නේ ඔහු සෑම තැනකම සිටින බව නොවෙයි. එක් එක් කෙනාට ඔහුගේම ජීවාත්මය ඇත. ඔවුන් පුරවන පෝරමයේ, මෙම ප්‍රශ්නය තිබේ ඔබගේ ජීවයේ පියා කවුරුන්ද? කෙසේවෙතත්, ඔවුන්ට මෙය වැටහෙන්නේ නැත. සියලුම ජීවයන්ට සිටින්නේ එක් පියෙක් පමණයි. අපි සියලු දෙනාම සහෝදරයන් වන අතර සිටින්නේ එක් පියාය. අපිට ජීවන-මුක්තියේ අපගේ උරුමය හිමි වන්නේ ඔහුගෙනි. විමුක්තිය ලබා දෙන්නා මෙන්ම මාර්ගෝපදේශකයාද ඔහුයි. ඔහු සියලුම ජීවාත්මයන්ව ආපසු මිහිරි නිවහනට රැගෙන යයි. පැරණි ලෝකය විනාශ වීමට තිබෙන්නේ මේ නිසාය. මිනිසුන් හෝලිකා උත්සවය සමරති. සියලුම ශරීර විනාශ වී, සියලුම ජීවාත්ම ආපසු නිවසට යයි. පසුව ස්වර්ණමය යුගයේ මිනිසුන් ඉතා සුළු පිරිසක් පමණක් සිටියි. ස්වර්ණමය යුගයේ ස්ථාපනය සිදු කරන්නේ කවුරුන්ද, එමෙන්ම කලි යුගයේ විනාශය සිදු කරන්නේ කවුරුන්ද කියා ඔබ වටහා ගත යුතුයි. මෙය පැහැදිලිව ලියා තිබේ. මෙසේ කියයි ඔබ සෙනෙහස ලබා දෙන විට, ඔබට සෙනෙහස ලැබෙයි. පියා පවසන්නේ මා වෙනුවෙන්, මනුෂ්‍යයන්ව දේවතාවන් බවට පරිවර්ථනය කිරීමට බොහෝ

සේවය කරන අයයි, වැඩියෙන් සෙනෙහසට බඳුන් වන්නේ. උත්සාහ දරණ අයට උසස් තත්ත්වයක් හිමි වෙයි. උත්තරීතර ජීවය වන පියාගෙන් ඔය ජීවාත්මයන්ට උරුමයක් ලැබීමට තිබෙයි. ඔබ ජීවාත්ම අවධානයට පත් විය යුතුයි. ඇතමුන් බොහෝ වැරදීම් සිදු කරන අතර ඔවුන්ගේ පරණ පුරුදු බොහෝ ස්ථිර වෙයි. ඔබ කෙතරම් විස්තර කළද, ඔවුන් එම පුරුදු අත් නොහරියි. ඒ තුළින් ඔවුන් තමන්ගේම තත්ත්වය පහත හෙළා ගනී. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිම දෙයක් ගැන තර්ක කරමින් ඔබගේ කාලය අපතේ නොහරින්න. ඔබගේ බුද්ධිය, නිෂ්ඵල කාරණා වලට භාවිත නොකළ යුතුයි. ඔබට හැකි තාක් පමණින්, සිහිපත් කිරීමේ වන්දනාවේ සිට, ඔබගේ පාපයන් දුරු කරගන්න. ජීවාත්ම අවධානයෙන් සිටීමේ පුරුද්ද ඇති කරගන්න.
2. ඔබගේ මුහුණ, මෙම පැරණි ලෝකයෙන් ඉවතට හරවන්න. සාමයේ දේශය සහ සතුටේ දේශය සිහි කරන්න. අළුත් නිවසක් ගොඩනැඟෙනවා. එබැවින් පැරණි එකෙන් ඔබගේ හදවත ඉවත් කරගන්න.

**වරදානය:** ඔබ නිරන්තරයෙන් බලයේ ප්‍රතිමූර්තියක් වී මෙම දිව්‍ය වංශය පිළිබඳ අවධානයෙන් මායාට මුහුණ දීමට හැකි වේවා.
ඕනෑම කාර්යක් සාර්ථක වීමට නම්, පළමුවෙන්ම, ඔබ බලයේ ප්‍රතිමූර්තියක් බව දැන ගන්න. ඔබට බලය ඇති විට, මායාට මුහුණ දීම පහසු වනු ඇත. ඔබේ අවධානය පරිදි, ඔබේ ස්වරූපයද එසේම වනු ඇත. එබැවින්, නිරන්තරයෙන් මෙම බලවත් අවධානය ඇති කරගන්න: මම මෙම අධ්‍යාත්මික උපතේ සිටින අතරතුර, මම සෑම තත්පරයකම, සෑම සිතිවිල්ලකම සහ සෑම කාර්යයකම දේව සේවයේ යෙදී සිටිමි. මෙය මගේ දේව වංශයයි. මෙම අවධානයේ ආසනය සියලු දුර්වලතා අවසන් කරනු ඇත.

**පාඨය:** සත්‍යය නියම වේලාවට ඉබේටම ඔප්පු වේ: එය ඔප්පු කිරීමට අවශ්‍ය නොවේ.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානීකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

සේවයේ සිටින බහුතරයකට පැමිණෙන ප්‍රධාන බාධකය නම්: මම මෙය කළෙමි. මට පමණක් මෙය කළ හැකිය. "මම" යන මෙම අවධානය පැමිණෙන විට, එය දැනුමේ මමත්වය, බුද්ධියේ මමත්වය හෝ සේවයේ මමත්වය ලෙස හැඳින්වේ. බාධක මෙම ආකාර හරහා පැමිණේ. මේ ආකාරයේ බාධක ජය ගැනීම සඳහා, සෑම විටම එක් වාක්‍ය ඛණ්ඩයක් මතක තබා ගන්න: මම උපකරණයක්. උපකරණයක් වීමෙන් පමණක් ඔබට අශාරීරික, පරාර්ථකාමී සහ නිහතමානී විය හැකි අතර (අපද්‍රව්‍ය) නිෂ්ඵල සිතිවිලි වලින් තොර අවධියක රැඳී සිටිය හැකිය. ඔබ මේවා ධාරණය කරගත් විට, වාතාවරණය බාධක වලින් නිදහස් වේ.